# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක 9,013—1942ක්වූ සැප්තැම්බර් මස 25 වෙනි දිනවූ සිකුරාද.

Part IV.—හතරවෙනි කාණ්ඩය.

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම අංක 2,420 (පුත්තලම).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් හෝ ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1942ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජයන්තක ඉඩමකැයි ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව සන්තකකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ 1942ක්වූ අගෝස්තු මස 29වෙනි දින පුත්තලම් කච්චේරියේදීය.

ආර්. මොහිපැති,
පුත්තලම් හලාවත දිස්ත්‍රික්කයේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුව.

---

(a) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(b) මෙකී ඉඩම්වලට හෝ එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට හෝ ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

(c) මෙහි පහත සඳහන්වන මායිම්වලට මැදිවූද මෙම දැන්වීමෙහි ඇතුළත් බිම්කට්ටිවලින් එකක් නොවූද යම්කිසි බිම්කට්ටියක් මෙම දැන්වීමෙන් විභාග නොකරණු ලැබේ. එවැනි බිම්කට්ටියකට අයිතිකම් කියාසිටීම උවමණා නොවේ.

### උප ලේඛනය.

වයඹ පලාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය කොඨාශයේ මාම්පුරි හෙවත් උතුරු අක්කරේපත්තුවේ කුරවන්කුඩිල් යන ගමේ මෙහි පහත සඳහන් බිම්කට්ටි :—

මුල් සිතියමේ අංක A 662.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 3 | කල්පලිකාඩු (සුසානභූමිය) .. | 0 | 3 | 8 |
| 5 | ඉලිප්පියාඩිකාඩු (පාරට වෙන්කරනලද ඉඩම) | 0 | 0 | 28 |
| 6 | කල්පාලිකාඩු (පාරට වෙන්කරනලද ඉඩම) .. | 0 | 1 | 19 |
| | | 1 | 1 | 15 |

මායිම්—උතුරට ඇම්. පී. මොහමදු ඉබ්‍රාහිම් ලෙබ්බේ අයිතිවාසිකම්කියන කල්පාලිතොට්ටම්; නැගෙනහිරට ඇම්. සෙල්ල මරික්කාර් හා සෙස්සන් විසින් අයිතිවාසිකම්කියන ඉලිප්පියාඩි තොට්ටම් සහ කල්පලිතොට්ටම් යන ඉඩම්ද, ඇම්. සී. මොහමදු හසිනමරික්කාර් හා සෙස්සන් විසින් අයිතිවාසිකම්කියන මුල් සිතියමේ A 662කෙහි ඉල්ලිප්පියාඩිකාඩු යන අංක 4දරන බිම්කට්ටියද, ඇස්. ඇම්. ඇස්. රම්නාදන් චෙට්ටියාර් විසින් අයිතිවාසිකම්කියන පී. පී. 76,589යෙහි පුලවෙනතොට්ටම් යන ඉඩම්ද; දකුණට ඇම්. ඇම්. ඇස්. රම්නාදන් චෙට්ටියාර් විසින් අයිතිවාසිකම්කියන මුල් සිතියම් A 662යේ පුලවෙනතොට්ටම්හි අංක 7 දරණ බිම්කට්ටිය සහ ආණ්ඩුව සන්තක පුලවෙනකාඩු යන ඉඩම්ද; බස්නාහිරට කේ. පී. ඇස්. මොහමදු කාසිම් මරික්කාර් විසින් අයිතිවාසිකම්කියන මුල් සිතියම් A 662කෙහි කල්පලිකාඩු යන බිම්කට්ටි අංක 2කද වේ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—පට්ටියගම ලිදක් බැන්දවීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නියිආකාර අණ ලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ අංක A 1,475. ගම—පට්ටියගම.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ලිදමුලවත්ත .. | වැවිලි නැති ඉඩම .. | ඌල්පාගොඩපතිරආරච්චිගේ මාතිස් කරුණානායක, එම සේදිරිස් කරුණානායක, එම පොලිස් කරුණානායක, එම චාර්ලෝසිංඤෝ කරුණානායක, එම බබීනෝනා කරුණානායක, එම ජේන්නෝනා කරුණානායක, එම දොන් ලූවිස් කරුණානායක, එම දොන් ජෝන්සිංඤෝ කරුණානායක, එම බබානෝනා කරුණානායක එම එමානෝනා කරුණානායක (සියල්ලදෙනාම) පට්ටියගම, පූගොඩ | 0 | 0 | 1·45 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මේ 1942ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින පස්වරු 3ට පූගොඩ ගම්සභා උසාවියේදී මා ඉදිරියට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට මනාවී සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට මනා බව මෙයින් දැනගත යුතුයි. ඉහතකී ඉඩමේ අයිතිවාසිකම ගැන ඇත්තාවූ ඔප්පු, උගස්කර, බදුකර, ගෙවල් බදු කුවිතාන්සි යනාදිය සමග පැමිණිය යුතුයි.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 17වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඇස්. ඇස්. නාවරත්නම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුව.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—වැසිකිළි නියිආකාර ශුද්ධකිරීමේ පහසුව සඳහා පිටිපස පටුමාවතක් යෙදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "203වන පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක ආණ්ඩුක්‍රම මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ අංක P. P. A 608. ගම—වත්තේගම (කොටසක්).

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | ගෙදරකුඹුරේවත්ත (වරිපනම් නොමැ මරයක් නැත), දැනටකඩාදමා තිබෙන වරිපනම් අංක 72; මීට ඇතුලත්වේ | අඹ, කොකෝ, පුවක්, මාරා, කෝපි, මුරුංගා යනාදී ගස් සහ ඇල්ලක් සහිත මුඩුබිම සහ වත්ත | කේ. වී. පෙරේරා නෝනා මහත්මී, අංක 73, ත්‍රිකුණාමලවීදිය, මහනුවර | 0 | 0 | 9 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2 | පිඹුරුපත් අංක 68න් කොටසක් .. | ඇල්ලකින් කොටසක් සහ අඹගහක් ඇති වත්ත | වත්තේගම හින්දු දේවාලේ භාරකාරයෝ | 0 | 0 | 2·59 |
| 3 | අන්කෙල්ලියද්දේවත්ත (පිඹුරුපත් අංක 64 & 65න් කොටසක්) | ඇල්ලකින් කොටසක් යුත් මුඩුබිම | වත්තේගම ඇම්. පොන් නයිදා | 0 | 0 | 0·78 |
| 4 | අන්කෙල්ලියද්දේවත්ත (පිඹුරුපත් අංක 62, 62A සහ 63න් කොටසක්) | ඇල්ලකින් කොටසක් යුත් මුඩුබිම | ඇම්. වෙල්ලයියා, වත්තේගම | 0 | 0 | 0·19 |
| 5 | අන්කෙල්ලියද්දේවත්ත, (පිඹුරුපත් නොම්මරයක් නැත) සහ පිඹුරුපත් අංක 53A දරන ඉඩම | දෙහිගසක්, කොසොඹගසක්, මුරුංගා ගසක්, ඇල්ලකින් කොටසක් සහ උළු සෙවිලිකල ගෙයක් සහිත වත්ත | වත්තේගම ඇම්. සුප්පයියා පුල්ලේ | 0 | 0 | 8·36 |
| 6 | අන්කෙල්ලියද්දේවත්ත, (පිඹුරුපත් නොම්මරයක් නැත) | උණපඳුරකින් කොටසක් යුත් වත්ත | වත්තේගම ඇම්. සුප්පයියා පුල්ලේ | 0 | 0 | 0·10 |
| 7 | කිරංකුඹුරේවනාත (පිඹුරුපත් අංක 55, 56 සහ 57න් කොටසක්) | උණපඳුරකින් කොටසක් යුත් ඇල්ලක් සහිත මුඩුබිම | වත්තේගම ඒ. හෙන්ද්‍රික් ප්‍රනාන්දු | 0 | 0 | 0·19 |
| 8 | කිරංකුඹුරේවනාත (පිඹුරුපත් අංක 56, 56 සහ 57න් කොටසක්) | පොල්ගසක් සහ ඇල්ලකින් කොටසක් යුත් මුඩුබිම | වත්තේගම ඒ. හෙන්ද්‍රික් ප්‍රනාන්දු | 0 | 0 | 0·88 |
| 9 | කිරංකුඹුරේවනාත, පිඹුරුපත් අංක 54න් කොටසක් | මුරුංගාගසකින් කොටසක් යුත් ඇල්ලක් සහිත මුඩුබිම | වත්තේගම ඇම්. කනගරත් | 0 | 0 | 0·56 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුව කල්පනාකර සිටින බව පොදුජනයාට දැනගැනීම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය මට 1942ක්වූ ඔක්තෝබර් මස 27වෙනි දින පෙරවරු 10ගේ කණිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මේ ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතියගේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 16වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ආර්. වයි. බැනියල්,
ආණ්ඩුවේ අතිරේක ඒජන්ත වමිහ.

---

ආණ්ඩුවේ ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ ප්‍රකාර ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තෙරිපහ ආණ්ඩුවේ පාඨශාලාවට උචිතනා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවේ ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5 වෙනි වගන්තියේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයපිට නියමකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 809 ගම—තෙරිපහ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | වතුකනත්තෙවත්ත .. | වත්ත .. | තෙරිපහේ මැදවැලේගෙදර පුංචිරාල .. | 0 | 1 | 0·7 |

එබැවින් එකී ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුව කල්පනාකර තිබෙන බව පොදුජනයාට දැනගැනීම සඳහා 6වෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය මට 1942ක්වූ ඔක්තෝබර් මස 19වෙනි දින පෙරවරු 10ගේ කණිසමට නුවරඑළියේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මේ ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතියගේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 17වෙනි දින
නුවරඑළියේ කච්චේරියේදීය.

සී. ජේ. ඕබ්‍රයන් ලැක්ස්ට්‍රි,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිහ.

---

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—සින්නපුවරසම්කුලමේහි පාඨශාලා ගොඩනැගිල්ලක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 වෙනි පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි වගන්තියේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට පලාත් පාලනය පිළිබඳ කාරක සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නියමකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. P. P. A 1,356. ගම—වවුනියා දිස්ත්‍රික්කයේ උතුරු වවුනියාවේ මැල්පත්තු සහ උදයාවූර්
නමැති කෝරළෙහි පිහිටි සින්නපුවරසම්කුලම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කන්වූරෙයකීවලවු .. | අවුරුදු 30ක් වයස ඇති තල්ගස් 4ක්ද, අවුරුදු 20ක් වයස ඇති තල්ගස් 3ක් සහ පොල්ගසක්ද, අවුරුදු 5ක් වයස ඇති කෙසෙල්පඳුරු 120ක්ද, මැටි ගසා ගොඩනගනලද පාඨශාලාවක් සහ බැඳපු ළිඳක්ද ඇති ඉඩමක් | ආනඅර්පුලියංකුලමේහි පදිංචි සින්නයියා උදයාර් සෙල්ලදුරේ සහ සිනනපුවරසම් කුලමේහි පදිංචි සින්නතම්බි කනපතියාගේ වැන්දඹු සැමිවන නාගම්මා | 0 | 2 | 18·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුව කල්පනාකර තිබෙන බව පොදුජනයාට දැනගැනීම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය මට 1942ක්වූ නොවැම්බර් මස 9වෙනි දින පෙරවරු 11ට සින්නපුවරසම්කුලමේහිදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑව සහ මේ ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතියගේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 21වෙනි දින
වවුනියාවේ කච්චේරියේදීය.

ආර්. ඇම්. බර්ජ්,
ආණ්ඩුවේ උප ඒජන්ත වමිහ.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

LW 5265

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1943 දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරි කපා ප්‍රයෝජනගැනීමේ බදු ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර් ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැනීමට බලය ඉල්ලාකරන ඉල්ලුම්පත්‍ර" යන වචන ඇන්විලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර මේ 1942ක්වූ ඔක්තෝබර් මස 8වෙනි දින පෙරවරු 10 වනතුරු බාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් කිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් ¼ කොටසක් එවලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් 1943 ජනවාරි මස පළමුවෙනිදට මත්තෙන් ගෙවන්ට ඕනෑය.

5. කැලෑවට යන්වෙනොදී ඉඩම හොඳ අන්දමින් නඩාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදයාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ විගාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරු නොකර ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

8. කූපන්දීට සඳහා කාරනා රබර්පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර්පාලකතුමා විසින් නියමකලගොත් ඉඩම පරීක්ෂාකිරීමට සහ තක්සේරුකිරීමට යන මුදලත් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

| අංක. | රෙජිස්ටර් අංක. | ගම | ඉඩම්වල විස්තර. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| | | | කුකුළු කෝරළය. | | | |
| 1 | 196S3R97 | පෙප්බිකන්ද | ලොට් 106, F. V. P. 243 | 0 | 2 | 20 |
| 2 | — | එම | ලොට් 113B, (කොටස්) F. V. P. 243 | 2 | 2 | 9 |
| 3 | — | එම | ලොට් 30AE (කොටස), F. V. P. 243 | 20 | 0 | 18 |
| 4 | 196S3R88 | එම | ලොට් 74 (කොටසක්), F. V. P. 243 | 0 | 0 | 15 |
| 5 | 192S3R212 | ගවරගිරිය | ලොට් 74C, V. P. 41 | 1 | 0 | 0 |
| 6 | 194S3R176 | පරගල | ලොට් 357B, F. V. P. 244 | 0 | 2 | 0 |
| 7 | — | අයගම | ලොට් 90B, F. V. P. 42 | 1 | 2 | 31 |
| 8 | — | එම | ලොට් 90C, F. V. P. 42 | 2 | 0 | 23 |
| 9 | 194S3R153 | උඹුගල | ලොට් 172C, F. V. P. 237 | 0 | 0 | 29 |
| 10 | 195S3R208 | මරතැල්ගොඩ | ලොට් 15 I, F. V. P. 254 | 3 | 0 | 0 |
| 11 | — | පරගල | ලොට් 216G (කොටසක්), F. V. P. 224 | 1 | 0 | 0 |
| | | | කුරුවිටි කෝරළය. | | | |
| 12 | — | එල්ලවල පහලකන්ද | ලොට් 9D, 19B, 19C, 19D, F. V. P. 324 | 5 | 1 | 4 |
| 13 | 193AS1R116 | දෙහියාගල | ලොට් 44 (කොටසක්), F. V. P. 711 | 0 | 1 | 0 |
| 14 | — | එල්ලවල පහලගම | ලොට් 203U, 214A, F. V. P. 317 | 5 | 2 | 22 |
| 15 | — | හුදුගල | ලොට් 24A, F. V. P. 329 | 1 | 0 | 1 |
| | | | නවදුන් කෝරළය. | | | |
| 16 | — | කරවිට | ලොට් 121, 122 සහ 124 (කොටස්), F. V. P. 39 | 1 | 0 | 0 |
| 17 | — | කිරිබත්ගල | ලොට් 89 (කොටසක්), F. V. P. 26 | 0 | 2 | 0 |
| | | | අටකලන් කෝරළය. | | | |
| 18 | — | කොටවිටල | ලොට් 81 (කොටසක්), V. P. 613 | 0 | 2 | 0 |

---

## ටෙන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### කොට්ටුපල් රේන්ද විකිණීම.

මේ 1943ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසානවන අවුරුද්දට හංවැල්ල, පූගොඩ, වෑවල, දිග්ගල සහ මුතුවාඩිය යන කොට්ටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස ඉල්ලුම්පත්‍ර මේ 1942ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින පෙරවරු 11ට කොළඹ කච්චේරියේදී දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධානතුමා විසින් භාරගනු ලැබේ. සියළුම ඉල්ලුම් පත්‍ර ඒ සඳහා පිළියෙලකර තිබෙන කොලවල ලියාදිය යුතුය. ඉල්ලුම්පත්‍රවලට පාඅම්ච්චිකරන කොල සහ විකිණීම සම්බන්ධව කොන්දේසි යනාදිය කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවට පැමිණීමෙන් ලබාගන්ට පුළුවන.

ඇල්. ෆර්ඩිනැන්ඩ්,
කොමිටියේ ප්‍රධානතැන වෙනුවට.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 17වෙනි දින
කොළඹ දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවේදීය.

---

## දිස්ත්‍රික් රෝඩ් කොමිටි පිළිබඳ දැන්වීම.

මේ 1861කේ ඔම්මාවත් සම්බන්ධ 24වෙනි වගන්තියේ ප්‍රකාර රත්නපුරේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියට මේ 1943, 1944 සහ 1945වන් එරෝපාකාර, බර්ගර් සහ සවෙද්සක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කලපනාකර තිබෙන බව තෝරගැනීමේ දවසට දසදවසක් ප්‍රථමයෙන් සබරගමු පලාතේ රත්නපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනට ලියවිල්ලකින් දැනුම්දෙන්ට ඕනෑ බව මෙයින් දන්වනවාය. මේ 1942ක්වූ නොවැම්බර් මස 25වෙනි දින පෙරවරු 11.30ට රත්නපුරේ කච්චේරියේදී තෝරගන්ට යෙදෙනවා ඇත.

ඩී. වනසුන්දර,
සෙක්‍රතාරිස් වම්හ.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 16වෙනි දින රත්නපුරේ
ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ කන්තෝරුවේදීය.

---

මේ 1861කේ ඔම්මාවත් සම්බන්ධ 24වෙනි වගන්තියේ ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික් රෝඩ් කොමිටියට මේ 1943, 1944 සහ 1945වන් එරෝපාකාර, බර්ගර් සහ සවෙද්සක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කලපනාකර තිබෙන බව තෝරගැනීමේ දවසට දසදවසක් ප්‍රථමයෙන් සබරගමු පලාතේ රත්නපුරේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධානතැනට ලියවිල්ලකින් දැනුම්දෙන්ට ඕනෑ බව මෙයින් දන්වනවාය. මේ 1942ක්වූ නොවැම්බර් මස 25වෙනි දින පෙරවරු 10ට කෑගල්ලේ කච්චේරියේදී තෝරගන්ට යෙදෙනවා ඇත.

ඩී. වනසුන්දර,
සෙක්‍රතාරිස් වම්හ.

මේ 1942ක්වූ සැප්තැම්බර් මස 16වෙනි දින රත්නපුරේ
ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.